# අදහසක්

## කැඩුන හාල් සහ හුනු සාල් [සුණු සහල්]



හාල් ගන්න කඩේට ගියාම දැක්කා කැඩුණ හාල් කියලා ගෝනියක් තියෙනවා. බලනකොට හුනුසාල්. මම හිතන්නෙ දැන් කාලේ වැඩි දෙනෙක් හුනු සාල් ගැන දන්නෙ නැති හින්දා වෙන්න ඇති කැඩුණ හාල් කියන්නෙ. අපේ අම්මා ඉස්සර උදේට කන්න හුනුසාල් බත් උයලා කොච්චි සම්බෝලයක් හදනවා. උණු උණුවෙ ඒක කනකොට දැනුණ රස මේ දැනුත් මට දැනෙනවා වගේ.

සමහර වෙලාවට හුනුසාල් බතටම පොල් ටිකක් දාලා කලවම් කරනවා. අපි ඒක කන්නෙ සීනිත් එකතු කරගෙන. කැකුළු හුනුසාල්වලින් උයන කිරිබත හරිම රසයි. ඉක්මනට උයා ගන්නත් පුලුවන්.

දුටුගැමුණු රජතුමා යුද්ද කර කර යන අතරේ බඩගිනි වෙලා ගෙදරකට ගියාම ඒ ගෙදර අම්මා උයලා දීලා තියෙන්නෙ හුනුසාල් කිරිබත් කියනවනෙ. කුමාරයා කිරිබත් කන විදිය බලාගෙන ඉඳලා ඒ අම්මා කිව්වලු පුතේ උඹ බත් කන්නෙ ගැමුණු කුමාරයා යුද්ද කරනවා වගේ කියලා.

**චන්දි කොඩිකාර**
ලේඛිකා

DOCUMENT TRANSLATIONS WITHIN A DAY
SWORN TRANSLATIONS ● NAATI TRANSLATIONS
ඕනෑම භාෂාවකට අයත් ලේඛණයක්
සීඝ්‍රගාමී පරිවර්තනය සඳහා
අප අමතන්න
03 9792 9977
සඳුදා සිට සිකුරාදා දක්වා
පෙ.ව 9.00 - ප.ව 5.00 දක්වා විවෘතයි.
1/44 King Street Dandenong VIC 3175
WARNALEGAL
Justice for all
03 9701 3718 info@warnalegal.com warnalegal1

31 වන පිටෙන්

කුරුප්පු මහතාට පුද කළෙමි. "මේ ශ්‍රේෂ්ට ලේඛකයාට මගේ කෘතවේදීත්වය පුද කරනු වස් මේ පොත ඔහුට පුද කරමි" යයි මම එහිදී කීවෙමි. ඩීබී වෙනුවෙන් පොත බාරගත්තේ වරුණ සාවින්ද ය.

ප්‍රමාණවත් ය.

නැවත මෙල්බනයට ගිය පසුව මම ඒ කාලයේ ඩීබීගේ නවාතැන වූ බුලීන්හි ඇනෙක්සියට ගොස් ඔහුට පොත පිළිගැන්නුවෙමි. මගේ කවි පොත ඔහුට පිළිගන්වා ඇති බව දුටු ඩීබී මහත් සතුටට පත්විය.

"මෙකෙක් කාලෙකට මට පොතක් පිළිගන්වලා තියෙන්නෙ එකම එක මිනිහයි. ඒ ලංකාවෙදි. මේ තමයි මට කවුරු හරි පොතක් පිළිගන්වපු දෙවන අවස්ථාව." ඔහු කිවේ ය.



රාජාලිපියාපත ඩීබීට පිළිගැන්වූ දා

මේ අවස්ථාවට අදාල වීඩියෝව මෙතැනින් බැලිය හැකිය
https://www.youtube.com/watch?v=6yzy9Td-MxY

ලංකාවේදී මා මෙවැන්නක් කළ බවක් ඩීබී දැන සිටියේ නැත. ඔහුට මේ බව කියා ලකුණු දමාගන්නට අවශ්‍යතාවක්ද මට නොවී ය. වෙන කිසිවකු නොකියන්නටද ඇත. ඩීබී කුරුප්පු නම් වන සාහිත්‍යකරුවාට මා අතින් සිදුවුණ බොහෝ දේ මෙන්ම මෙයද මියයන තෙක්ම ඩීබී එය නොදැන සිටින්නටද ඇත. මම ඔහු පිලිබඳ මගේ කෘතවේදීත්වය එසේ ප්‍රකාශ කර මගේ සිතේ වූ බර සැහැල්ලු කර ගෙන නිහඬව සිටියෙමි. ඒ සැනසීම මට

මා ඩීබී ගේ ඇනෙක්සියේදී ඔහුට පොත පිළිගන්වන අවස්ථාවේදී ගත් මේ සේයාරුවේ පිටපතක් මම පසුව ඔහුට දුන්නෙමි. ඔහු බුලීන් නිවසින් යන තෙක්ම ඒ සේයාරුව ඒ කුඩා සාලයේ කාටත් පෙනෙන තැනක තබාගෙන සිටියේ ය.

ඒ සේයාරුව ඔහුගේ අවමංගල උත්සවයේදී ඔහුගේ දේහය තබා තිබූ තැනට ඔබ්බෙන් වූ තිරයේ ප්‍රදර්ශනය වූ සෑම අවස්තාවකදීම මට එදා පොත පිළිගැන්වූ අවස්ථාවේ ඩීබීගේ ඇස්වල තිබූ සතුට මුහුණේ ඇඳුණ සිනාව නැවත නැවතත් සිහිපත් විය.

FOR ALL YOUR TRANSLATIONS
PROFESSIONAL TRANSLATOR
NAATI accredited (Level 3)
( ENGLISH SINHALESE)
Documents for immigration purposes
• BIRTH , MARRIAGE, DEATH
• EDUCATIONAL/ VOCATIONAL
• LEGAL and POLICE DOCUMENTS
• NATIONAL IDENTITY CARDS
CONTACT
DR. PREMA KUDALIGAMA
( BA, PGDE, M.A. Ph.D (Edu.)
NAATI Level 3 (Interpreting & Translating)
Tel:(03) 94671658 mob: 0458 60 60 66
Email: premaku@bigpond.com